# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/40 - 2020 ඔක්තෝබර් මස 07 වැනි බදාදා - 2020.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන ලියාපදිංචි අංක පී.වී. 66705 දරන කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2020 පෙබරවාරි මස 27 වැනි දින අංක 2164/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය විසින්, (SLQF11 වන ස්ථරය) හෙද පිළිබඳ දර්ශනපති උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන් හි (SLQF) නියම කරනු ලැබ ඇති ආකාරයෙන්

පහත සඳහන් අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය ඃ

(අ) ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී අදාළ විෂයය ක්ෂේත්‍රය යටතේ, අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් සමග SLQF 6 වන මට්ටමෙහි ගෞරව ප්‍රථම උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ආ) ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී සම්බන්ධිත විෂයය ක්ෂේත්‍රයක් යටතේ අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් සමග (SLQF) 6 වන මට්ටමෙහි ගෞරව ප්‍රථම උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ යෝග්‍යතා පරීක්ෂණයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ඇ) GPA අගය 0-4ක පරිමාණයකින් අවම වශයෙන් 3.0 අගයක් සමග ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී SLQF 5 වන මට්ටමෙහි ප්‍රථම උපාධියක් සාර්ථක ලෙස අවසන් කර තිබීම සහ සමාන හෝ සම්බන්ධිත විෂය ක්ෂේත්‍රයන් යටතේ SLQF 6 වන මට්ටමට සමාන වන පරිදි අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ඈ) අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 7 වන මට්ටම හෝ ඊට ඉහළ මට්ටමක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ඉ) GPA අගය 0-4ක පරිමාණයකින් අවම වශයෙන් 3 අගයක් සහිතව NVQ 7 වන මට්ටම සාර්ථකව සම්පූර්ණ කිරීම සහ එම විශේෂඥ ක්ෂේත්‍රයට ඇතුළත්වීම සඳහා නිශ්චිත බලධරයා විසින් නිශ්චය කළ හැකි පරිදි, SLQF 6 වන හෝ 7 වන මට්ටමට සමානව අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය, හඳුනාගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| හෙද පිළිබඳ දර්ශනපති | එම්ෆිල් (හෙද) |

මහාචාර්ය ජී. එල්. පීරිස්,
අධ්‍යාපන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

10 - 866

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.